දුම්රිය
புகையிரத
Railway — GMF 35

ඔබේ අංකය
உமது இல
Your No.

දුරකථනය (දු.සා)
தொலைபேசி (இ.பு.பொ.மு)
Telephone
*E- mail*: gmrsir@sltnet.lk

කාර්යාලය
அலுவலகம்
Office — 2421281

ෆැක්ස්
தொலைநகல்
Fax — 2446490

මගේ අංකය
எனது இல
My No. — GMR/Media/03/27/2026

සාමාන්‍යාධිකාරී කාර්යාලය,
තැ.පෙ. 355, ඕල්කොට් මාවත,
කොළඹ 10.

பொது முகாமையாளர்
அலுவலகம்
த. பெ. 355இ ஒல்கொட்
மாவத்தை
கொழும்பு 10

General Manager's Office,
P.O. Box 355, Olcott Mawatha,
Colombo 10.

# ශ්‍රී ලංකා දුම්රිය සේවය
# இலங்கை புகையிரத சேவை
# SRI LANKA RAILWAYS

දිනය
தேதி
Date — 2026/03/27

**<u>"දිට්වා" සුළි කුණාටුවෙන් විනාශ වූ අඹේපුස්ස - අලව්ව අතර බුජ්ජොමුව පාලම ස්ථිරව සවිකිරීම සඳහා දුම්රිය ධාවනය එක් මාර්ගයකට පමණක් සීමා කිරීම - (01/04/2026 සිට 05/04/2026 දක්වා)</u>**

"දිට්වා" සුළි කුණාටුවෙන් අඹේපුස්ස - අලව්ව අතර බුජ්ජොමුව දුම්රිය ස්ථානය ආසන්නයේ දුම්රිය මාර්ගයේ පැවති පැරණි ගඩොලින් කරනලද ආරුක්කු හැඩති බෝක්කුව, අසලින් ගලා බසින මාඔය දෙසට තල්ලු වී කැඩීයාම හේතුවෙන් දුම්රිය මාර්ගය යටින් අඩි 45 ක පමණ කුහරයක් සෑදීම නිසා තාවකාලික පාලමක් යොදා ප්‍රධාන මාර්ගය ඉහළ සහ පහළ දුම්රිය ධාවන වේගය පාලම මතින් පැයට කිලෝමීටර් 10 කට සීමා කර මේ දක්වා දුම්රිය ධාවනය සිදු කරන ලදී.

01/04/2026 සිට 05/04/2026 දක්වා දීර්ඝ සති අන්තයේදී ඉහත තාවකාලික පාලම ඉවත් කර ඉහළ සහ පහළ මාර්ග සඳහා ස්ථිර පාලමක් සවි කර වේග සීමා ඉවත් කර දුම්රිය ධාවනයට සැලසුම් කර ඇත.

දුම්රිය මාර්ගයේ මෙම ස්ථිර යථාවත් කිරීම් කරන 01/04/2026 සිට 05/04/2026 කාලය තුල අඹේපුස්ස / අලව්ව අතර දුම්රිය ධාවනය පහත ආකාරයට සිදුවේ.

1. 01/04/2026 දින සිට 05/04/2026 දින පෙ.ව.06.00 දක්වා කාලය තුල අඹේපුස්ස / අලව්ව අතර දුම්රිය ධාවනය තනි මාර්ගයකට පමණක් සීමා කෙරේ.

2. 01, 02, 03 සහ 04 /04/2026 යන දින වල පහත දුම්රියන් අඹේපුස්ස දක්වා සීමා කෙරේ.

| දුම්රිය අංකය | සිට /දක්වා | කොළඹ කොටුව පිටත්වීම |
|---|---|---|
| 125 | කොළඹ කොටුව/ රඹුක්කන | පෙ.ව.4.25 |
| 170 | කොළඹ කොටුව/ රඹුක්කන | ප.ව. 3.45 |

3. 02/04/2026 දින පමණක් පහත දුම්රියන් අවලංගු කෙරේ

| දුම්රිය අංකය | සිට /දක්වා | කොළඹ කොටුව පිටත්වීම |
|---|---|---|
| 168 | කොළඹ කොටුව/ රඹුක්කන | ප.ව. 5.00 |
| 585 | රඹුක්කන/කොළඹ කොටුව | ප.ව. 8.05 |

මේ හේතුවෙන් **01/04/2026 දින සිට 05/04/2026 දින පෙ.ව.06.00** දක්වා කොළඹ කොටුව - රඹුක්කන/මහව /ත්‍රිකුණාමලය/මඩකලපුව දක්වා ඉහළ සහ පහළ ගමන් කරන දුම්රියන් ප්‍රමාද විය හැක.

සිදුවිය හැකි දුම්රිය ප්‍රමාදයන් නිසා මගී ජනතාවට සිදුවන අපහසුතාවය සම්බන්ධව දුම්රිය දෙපාර්තමේන්තුව කණගාටුවට ප්‍රකාශ කරන අතර මේ පිළිබඳ ජනමාධ්‍ය මගින් මගී ජනතාව දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිමි.

G.D.A සමරසිංහ
අධිකාරී (ගමනාගමන)
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට